## 1.1 හැඳින්වීම

ගැමි ජනයාගේ ජන ජීවිතයේ සෞන්දර්යාත්මක පැතිකඩ විවරණය කැරෙන සොඳුරු කලාංගයක් ලෙස ජන කවිය අර්ථ ගැන්විය හැක. මිනිසාගේ සිත තුළ නිපන් අව්‍යාජ සිතුවිලි කවිපද ලෙස ඉදිරිපත් කිරීමට තරම් හෙළ ගැමියා තුළ සහජ කවීත්වයක් විය. ගැමියාගේ භාවමය සිතුවිලි විවරණය කිරීමට යොදාගත් නාද මාලාව කර්ණරසායනය. ප්‍රේක්ෂක සහෘදයාගේ සවන්පත් අතර ශබ්ද මාධූර්යයෙන් හා අර්ථ මාධූර්යයෙන් ආඪ්‍යතර වූ කවි පද නිනාද කරවීමට ගැමියා සමත් විය. සරල නාද මාලාවක් ඔස්සේ ලගන්නා පද පෙළකින් ශ්‍රාවකයාගේ සිත තුළ චිත්ත රූපාවලි මැවීමට ජන කවියකට ශක්‍යතාවය පවතී. ගැමියා ජන කවි තුළින් අර්ථ සම්ප්‍රේෂණය කරමින් සන්නිවේදනයෙහි යෙදෙයි. සංඥාර්ථවේදය යනු සන්නිවේදනය පිළිබඳ එක්තරා ඥාන ශාඛාවකි. සංඥාවල අර්ථය පිළිබඳ හැදෑරීම "සංඥා+අර්ථ+වේදය" යනුවෙන් හැඳින්වේ. ගැමියා සංඥා පද්ධතියක් ඇසුරු කර ගනිමින් ජන කවිය ඔස්සේ අර්ථ සම්ප්‍රේෂණය සිදු කරනු ලබයි. එම සංඥා පද්ධතිය භාෂාව නමින් හැඳින්වෙයි. ගැමි කවියේ භාෂාව සිංහල සමාජ සංස්කෘතිය ඇසුරින් සුපෝෂිත වී ඇත. ජන ජීවන සුවඳ වහනය වන ගැමි කවිය නම් වූ කවි මල පොහොනි වී ඇත්තේ උපමා, අලංකාර, එළිසමය, වක්‍රෝක්ති ආදිය කරණකොට ගනිමිනි. ජන කවි භාෂාව, නාද මාලාව ආදිය ඇසුරෙන් ජන කවියා මානව අවකාශය වෙතට සංඥා සම්ප්‍රේෂණය කිරීමට උත්සාහ දරයි.

ගැමි කවියෙහි ශබ්ද සංඥා, වාච්‍ය සංඥා හා දෘශ්‍ය සංඥා අන්තර්.සහ සම්බන්ධයෙන් පවතී. ගැමියා ජන කවි ගායනයට සමගාමීව ශරීර භාෂාව ඔස්සේ ද සංඥා නිකුත් කරයි. ගැමියාගේ ශරීර භාෂාව මගින් ඔවුන්ගේ අභ්‍යන්තර සිතුවිලි විවරණය කැරෙයි. මිනිසාගේ සිරුර මනෝ කායික පද්ධතියකි. එබැවින් මනස මුල්වීමෙන් සිදුවන කායික වෙනස්වීම් මත නිර්මාණය වන ශාරීරික රිද්මය ගැමි කවිය තුළ අන්තර්ගත වෙයි. ශාරීරික වශයෙන් ප්‍රකාශ වන දෘශ්‍ය සංඥා මගින් ජන ගායනයේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ.

මිනිසා භාෂාව නම් වූ සංඥා පද්ධතිය වාහක කරගනිමින් අන්තර් සන්නිවේදනයෙහි යෙදෙයි. සංඥා මිනිසුන් වෙත ගෙන යාමට 'සංකේත' සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි. සංකේතයකට වස්තුවක් හෝ අර්ථයක් නිරූපනය කිරීමේ ශක්‍යතාවය පවතී. ගැමි භාෂා

පද්ධතිය ඇසුරින් නිර්මාණය වූ කවි පද වාච්‍යාර්ථය හා ව්‍යංගාර්ථය යන ද්විඅංශ ඔස්සේ අර්ථකථනය කළ හැක.

ගැමි කවි නාද සංඥා මගින් ද ගැමියා අන්තර් සන්නිවේදනයෙහි යෙදුණි. සංඥාර්ථවේදී ප්‍රවේශයක් තුළින් ගැමි කවි භාෂාව, ගැමි කවි නාද මාලා ඔස්සේ ගොඩ නැගෙන සංඥා හා දෘශ්‍ය සංඥා ඔස්සේ නිරූපණය කැරෙන සංඥාර්ථයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක නිරත වීම කාලෝචිතය. ගැමි කවිය අද්‍යතනයේ මිනිසුන් අතර ව්‍යවහාරයෙහි නොපැවතීම නිසා ගිලිහීයාමට ලක්වන සොඳුරු ජන සාහිත්‍යාංගයකි. ගැමි කවිය ඔස්සේ මිනිසුන් ඉදිරිපත් කළ කවි සිතුවිලි විනිවිදමින් ඒ ඔස්සේ සංඥාර්ථවේදී කියවීමකට ප්‍රවේශවීම මාගේ නිබන්ධනයෙහි ප්‍රධාන අභිප්‍රේතාර්ථයකි.

ජන කවිය සරල ගී නිර්මාණකරණය තුළ සුවිශේෂී මැදිහත් වීමක් සිදුකර ඇත. ජන කවිය සෘජු ලෙසම ඇසුරු කරගනිමින් නිර්මාණය කළ සරල ගී මෙන්ම බොහෝ සරල ගී නිර්මාණ තුළ ජන ගීයෙහි සේයාව වෙනත් සංගීත ශෛලීන් හා සම්මිශ්‍රිතව ප්‍රතිනිර්මාණය වේ. බටහිර සංගීතය හා ජන කවියෙහි සංකලනය, රාගධාරී සංගීතය හා ජන කවියෙහි සංකලනය ආදි වශයෙන් ගොඩනැගුණු සුසංයෝජන බොහෝ සරල ගීත නිර්මාණ තුළ විද්‍යමාන වෙයි. මුඛ පරම්පරාගතව ජන කවිය මිනිසුන් අතර සංසරණය වන්නේ එහි ඇති සංඥාර්ථවේදී ලක්ෂණ නිසාය. සරල ගීතයෙහි පද රචනාව, නාද මාලාව හා ගීතය විසින් අපේක්ෂා කරනු ලබන භාව අර්ථයට සමගාමීව මැවෙන ප්‍රතිරූපය නිර්මාණය කිරීමට ජන කවිය සාධාරණීය මැදිහත් වීමක් සිදු කරනු ලබයි. සිංහල සමාජ සංස්කෘතියෙහි ජීවත්වන මිනිසුන් අතින් නිර්මාණය වන ඕනෑම කලාංගයක් තුළ කුඩා අවධියේ පටන් ඇසුරු කළ සමාජ පරිසරයෙහි ආභාෂය හා ප්‍රගුණ කළ කලාත්මක රසඥතාවය අන්තර්ගතවීම සාමාන්‍යය. ජන කවියෙන් ප්‍රකට වන සංඥාර්ථවේදී ලක්ෂණ කොතෙක් දුරට සරල ගී තුළ නිරූපණය වන්නේදැයි අධ්‍යයනය කරමි. ගැමි කවිය යනු වාච්‍ය, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සංඥා ඔස්සේ තොරතුරු සංජානනය කරන ක්‍රියාවලියක් වන අතර එම ක්‍රියාවලිය සරල ගී නිර්මාණ භූමිකාව තුළ සිය ආධිපත්‍යය හසුරුවන යුරු අපූර්වත්වයෙන් යුතුය.

ගැමි කවියෙහි නිරූපිත සංඥාර්ථවේදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදෙන අතර එම සංඥා සමූහය සරල ගී තුළ නිරූපනය වී ඇතියුරු අධ්‍යයනය කිරීමට මෙහිදී මා අපේක්ෂා කරමි.